# ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය

## ඇබෑර්තු

### ලිපිකරු හා සමාන්තර ශ්‍රේණි

**කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය - රත්මලාන පරිශ්‍රය සහ සූරියවැව පරිශ්‍රය - දක්ෂිණ මණ්ඩපය සූරියවැව**

01. **කළමනාකරණ සහකාර (ලිපිකරු සේවා) III ශ්‍රේණිය**

**වැටුප් පරිමාණය :** U-MN I (III) – Rs. 30,725 – 17x300 – 35,825 p.m

**අවම සුදුසුකම් :**

**බාහිර අයදුම්කරුවන්**

01. i. සිංහල භාෂාව/ දෙමළ භාෂාව
    ii. ඉංග්‍රීසි භාෂාව/ ඉංග්‍රීසි සාහිත්‍ය
    iii. ගණිතය

යන විෂයන්ගෙන් විෂයන් 03 ටම සම්මාන සමාර්ථ සහිතව එක් වරකදී අ.පො.ස (සා.පෙළ) විභාගයෙන් විෂයන් 06 කින් සමත් වී තිබීම.

02. එක් වරකදී අ.පො.ස. (උ/පෙළ) විභාගයෙන් සියලුම විෂයන් (පොදු පරීක්ෂණය හැර) සමත් වී තිබීම.

(අ) පිළිගත් ආයතනයකින් ලබාගත් මාස 06 කට නොඅඩු කාල සීමාවක පරිගණක යෙදවුම් පිළිබඳ පිළිගත හැකි සුදුසුකමක් ලබා ඇති අයට වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ.

සහ

(ආ) පරිගණ යෙදවුම් මෘදුකාංග පිළිබඳ වසර 02 පළපුරුද්ද.

**අභ්‍යන්තර අයදුම්කරුවන් (සීමිත)**

01. අ.පො.ස (සා/පෙළ) විභාගය දෙවතාවකට නොවැඩි වාර ගණනකදී අවම වශයෙන් සම්මාන සාමාර්ථයන් දෙකක් සහිතව විෂයයන් හයකට නොඅඩු සංඛ්‍යාවක් සමඟ සමත්ව තිබිය යුතුය.

සහ

02. කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයෙහි ප්‍රාථමික මට්ටමේ ස්ථිර තනතුරක් දරන යු-පීඑල් වැටුප් පරිමාණයේ තනතුරක සේවයෙහි ස්ථිර කරන ලද සහ අවම වශයෙන් අවුරුදු 05 ක අඛණ්ඩ සතුටුදායක සේවයක් සම්පූර්ණ කරන ලද සේවකයෙකු විය යුතුයි.

**වයස :** අවු. 18 ට නොඅඩු සහ 30 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන්ට උපරිම වයස් සීමාව බල නොපායි.

**තෝරාගැනීමේ ක්‍රමවේදය:** අභියෝග්‍යතා පරීක්ෂණයකින් සහ සම්මුඛ පරීක්ෂණයක් මගින්

- සිංහල/දෙමළ සහ ඉංග්‍රීසි භාෂාව පිළිබඳ දැනුම
- බුද්ධි පරීක්ෂණය සහ සාමාන්‍ය දැනුම
- පරිගණක සාක්ෂරතාව

* ලිඛිත පරීක්ෂණය ඉංග්‍රීසි භාෂාවෙන් සහ සිංහල භාෂාවෙන් පවත්වනු ලැබේ.

**කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය - රත්මලාන පරිශ්‍රය**

**02. පුස්තකාල තොරතුරු සහකාර III ශ්‍රේණිය**
**වැටුප් පරිමාණය :** U-MN I (III) – Rs. 30,725 – 17x300 – 35,825 p.m

**අවම සුදුසුකම් :**

**බාහිර අයදුම්කරුවන්**

01. i. සිංහල භාෂාව/ දෙමළ භාෂාව
ii. ඉංග්‍රීසි භාෂාව/ ඉංග්‍රීසි සාහිත්‍ය
iii. ගණිතය

යන විෂයන්ගෙන් විෂයන් 03 ටම සම්මාන සමාර්ථ සහිතව එක් වරකදී අ.පො.ස (සා.පෙළ) විභාගයෙන් විෂයන් 06 කින් සමත් වී තිබීම.

සහ

02. එක් වරකදී අ.පො.ස. (උ/පෙළ) විභාගයෙන් සියලුම විෂයන් (පොදු පරීක්ෂණය හැර) සමත් වී තිබීම. (පැරණි නිර්දේශය යටතේ එක් වරකදී විෂය 03 කින් සමත් වී තිබීම ද ප්‍රමාණවත්ය)

සහ

පහත සුදුසුකම් සපුරා ඇති අයට වැඩි සැළකිල්ලක් දක්වනු ලැබේ.

(අ). පිළිගත් ආයතනයක් මගින් ලබා ගත් පුස්තකාල හා තොරතුරු විද්‍යා විෂයෙහි ශිෂ්‍යභාවය හෝ අර්ධ කාලීන / පූර්ණ කාලීන සුදුසුකම් ලබා තිබීම.

සහ

(අ). පිළිගත් ආයතනයකින් ලබාගත් මාස 06 කට නොඅඩු කාල සීමාවක පරිගණක යෙදවුම් පිළිබඳ පිළිගත හැකි සුදුසුකමක්.

**01. අභ්‍යන්තර අයදුම්කරුවන්**

i. සිංහල භාෂාව/ දෙමළ භාෂාව
ii. ඉංග්‍රීසි භාෂාව/ ඉංග්‍රීසි සාහිත්‍ය
iii. ගණිතය

යන විෂයන්ගෙන් අවම වශයෙන් විෂයන් 03 ටම සම්මාන සමාර්ථ සහිතව දෙවරකට නොඅඩු වාර ගණනකදී අ.පො.ස (සා.පෙළ) විභාගයෙන් විෂයන් 06 කින් සමත් වී තිබීම.

සහ

**02.** යූ-පීඑල් වැටුප් පරිමාණයේ දැක්වෙන වැටුපකින් යුත් ප්‍රාථමික මට්ටමේ ස්ථිර තනතුරක් දරන සහ කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයේ පුස්තකාලයක යූ-පීඑල් ප්‍රාථමික ස්ථිර තනතුරක වසර 05 ක අඛණ්ඩ සතුටුදායක සේවයක් සම්පූර්ණ කරන ලද සේවකයෙකු විය යුතුය.

* පිළිගත් ආයතනයකින් ලබාගත් මාස 06 කට නොඅඩු කාල සීමාවක පරිගණක යෙදවුම් පිළිබඳ පිළිගත හැකි සුදුසුකමක් ලබා ඇති අයට ප්‍රමුඛතාවයක් දක්වනු ලැබේ.

**වයස :** අවු. 18 ට නොඅඩු සහ 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන්ට උපරිම වයස් සීමාව බල නොපායි.

**තෝරාගැනීමේ ක්‍රමවේදය :** අභියෝග්‍යතා පරීක්ෂණයකින් සහ සම්මුඛ පරීක්ෂණයක් මගින්

පහත සඳහන් විෂයයන්ගෙන් සමන්විත අභියෝග්‍යතා පරීක්ෂණයක් :

- සිංහල/දෙමළ සහ ඉංග්‍රීසි භාෂාව පිළිබඳ දැනුම
- බුද්ධි පරීක්ෂණය සහ සාමාන්‍ය දැනුම
- පරිගණක සාක්ෂරතාව
- විෂය දැනුම

* ලිඛිත පරීක්ෂණය ඉංග්‍රීසි භාෂාවෙන් සහ සිංහල භාෂාවෙන් පවත්වනු ලැබේ.

**පොදු කොන්දේසි**

01. යහපත් චරිතයකින් හෙබි ශ්‍රී ලාංකික පුරවැසියකු විය යුතුය.

02. තෝරා ගන්නා අයදුම්කරුවන්, සේවක අර්ථසාධක අරමුදලේ සාමාජිකයකු වනු ඇත. ඔහු / ඇය, සිය මාසික වැටුපෙන් 10%ක මුදලක් අරමුදලට දායකත්වය දරන අතර ඊට සමගාමීව විශ්ව විද්‍යාලය එම වැටුපෙන් 15%ක මුදලක් දායක කරනු ඇත. 1980 අංක 46 දරන සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදලේ ප්‍රතිපාදනවලට අනුව විශ්ව විද්‍යාල වැටුපෙන් 3%ක මුදලක්, සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදලට දායක කරනු ඇත.

03. පත්වීමේ සෙසු කොන්දේසි, 1981 අංක 68 දරන ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාල පනතේ ප්‍රතිපාදන වලට අනුකූල වේ.

04. විශ්ව විද්‍යාල / ආයතන / රජයේ දෙපාර්තමේන්තු / සංස්ථා හෝ ව්‍යවස්ථාපිත මණ්ඩල වල අයදුම්කරුවන් සිය අයදුම්පත් අදාළ ආයතනවල ප්‍රධානීන් මගින් එවිය යුතුය.

05. සම්මුඛ පරීක්ෂණයට කැඳවීම සඳහා අයදුම්කරුවන් කෙටි ලැයිස්තුගත කිරීමේ අයිතිය විශ්ව විද්‍යාලය සතු වෙයි.

06. උප්පැන්න සහතිකය, අ.පො.ස.(සා.පෙළ), අ.පො.ස.(උ.පෙළ) සහතික වල හා පළපුරුද්දට අදාළ වෙනත් සහතික වල පිටපත් අයදුම් පත්‍රය සමඟ අමුණා එවිය යුතුය.

07. කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාල වෙබ් අඩවියක් බාගත කරගත හැකි ආකෘතියට අනුව පමණක් අදාළ තනතුර සඳහා ඉල්ලුම් කරන ලෙස අයදුම්කරුවන්ට තරයේ දන්වා සිටිනු ලැබේ. එම අකෘතියට අදාළ නොවන, පමාවී ලැබෙන හෝ අසම්පූර්ණ හෝ ඉහත අංක 04 කොන්දේසියට අනුකූල නොවන අයදුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

08. අයදුම්පත්‍ර බහා එවන ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ ඉල්ලුම් කරන තනතුර සඳහන් කළ යුතු අතර, නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත්, ලේඛකාධිකාරී, ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලය, රත්මලාන යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් යොමු කළ යුතුය.

09. අයදුම්පත් භාරගන්නා අවසාන දිනය 2024.03.31